වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යාංශය

ඇබෑර්තු

පහත විෂය ක්ෂේත්‍රයන්හි පුරප්පාඩු තනතුරු සඳහා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයෙහි සේවය කිරීමට සුදුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

කථිකාචාර්ය(ආධුනික)/ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)/මහාචාර්ය

හෝටල් කළමනාකරණය, ඉදිකිරීම් තාක්ෂණය සහ සම්පත් කළමනාකරණය, ඉංග්‍රීසි, බහුමාධ්‍ය සහ ජාල තාක්ෂණය, ප්‍රමාණ සමීක්ෂණය, ගොඩනැගිලි සේවා තාක්ෂණය, නිෂ්පාදන තාක්ෂණය, අධ්‍යාපන තාක්ෂණය, ආහාර සැකසුම් තාක්ෂණය, චිත්‍රපට හා රූපවාහිනී නිෂ්පාදන තාක්ෂණය (සිනමා ඡායාරූපකරණය, සිනමා සහ රූපවාහිනී නිෂ්පාදනය, සිනමා සහ රූපවාහිනී පසු නිෂ්පාදනය)

තනතුරේ ස්වභාවය

සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදලට දායක වන අනෙකුත් දීමනා සහිත ස්ථිර තනතුරකි.

වයස් සීමාව

- **කථිකාචාර්ය(ආධුනික)/ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)** - වයස අවුරුදු විසිදෙක (22) ට නො අඩු අවුරුදු හැට (60) ට නොවැඩි විය යුතුය.
- **මහාචාර්ය** - වයස අවුරුදු තිහ (30) ට නො අඩු අවුරුදු හැට (60) ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2016/12/15 දිනැති අංක 17/2016 දරණ චක්‍රලේඛනයෙහි ප්‍රතිපාදනයන්ට අනුව වැටුප් ගෙවනු ලැබේ.

තෝරා ගැනීමේ ක්‍රමවේදය

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

අයදුම්පත, අවශ්‍ය සුදුසුකම් පිළිබඳ විස්තර සහ වැඩිදුර තොරතුරු www.univotec.ac.lk වෙබ් අඩවියෙන් ලබාගත හැක.

අනෙකුත් කොන්දේසි

- අධ්‍යාපනික හා වෘත්තීයමය සුදුසුකම් ඇතුළත්ව නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, සහතික කරන ලද සහතිකවල පිටපත් සමඟ 2020 මාර්තු 13 දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්. නො.100, කඳවල, රත්මලාන යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය .
- උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය දෙපාර්තමේන්තු සහ සංස්ථාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන් මඟින් අයදුම්පත් එවිය යුතුය.
- සප්ත වාර්ෂික නිවාඩු ගත කරන අයදුම්කරුවන් හට අයදුම්පත් යොමු කළ හැක.
- අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.
- අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබනුයේ තෝරා ගත් අයදුම්කරුවන් පමණි.

උපකුලපති / නිසි බලධාරී

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය
100, කඳවල, රත්මලාන.
2020 පෙබරවාරි 16

දුරකථන : 011 2630700
ෆැක්ස් : 011 2630707
වෙබ් : www.univotec.ac.lk